# ශ්‍රී ලංකාවේ පවතින 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයට පවතින දෙමාපිය බලපෑමේ ඵලදායිතාවය (බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක 3ක් ඇසුරින්)

**බී. එම්. එන්. එම්. තිලකරත්න**[1]

## සංක්ෂේපය

වර්තමානයේ ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනය තුළ පවතින විභාග ක්‍රමයේ පළමුවන කඩඉම ලෙස ශිෂ්‍යත්ව විභාගය හඳුන්වා දිය හැකිය. රජය මගින් මෙම විභාගය පැවැත්වීමේ ප්‍රධාන අරමුණක් වශයෙන් අඩු ආදායම්ලාභී පවුලවල ළමුන්ට ශිෂ්‍යාධාර අරමුදල් ලබාදීම හා ළමුන්ගෙන් අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා වැඩි පහසුකම් සහිත පාසල්වලට ළමුන් යොමු කිරිම දැක්විය හැකිය. නමුත් වර්තමානය වන විට ශිෂ්‍යත්ව විභාගය සම්බන්ධයෙන් දෙමාපියන්ගේ ප්‍රධාන අරමුණ වනුයේ, තම දරුවා ජනප්‍රිය පාසලකට ඇතුළත් කර ගැනිම ය. එම නිසා දෙමාපියන් අතර ශිෂ්‍යත්ව විභාගය කෙරේ දැඩි තරඟකාරික්වයක් පවති. මෙම තරඟකාරිත්වයේ සැබෑ ඵලදායිතාවයක් තිබේද යන්න අධ්‍යනය කිරිම අරමුණු කරගෙන මෙම පර්යේෂණය සිදු කරන ලදි. එහිදී බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක 3 නියෝජනය වන පරිදි අහඹු ලෙස තෝරාගත් සිසුන් 150ක නියැදියට ප්‍රශ්නාවලි ක්‍රමයක් සම්මුඛ සාකච්ඡා ක්‍රමය මගින් ප්‍රශ්න යොමු කරන ලදී . එහිදි බහුතරයක් සිසුන්ට මෙම විභාගය මානසික පීඩාවක් බවට පත්වි ඇති බව අනාවරණය විය. තවද දෙමාපිය බලපෑම මත මිස ශිෂ්‍යත්ව විභාගය ඉහළින් සමත් වීමේ හෝ වෙනත් පාසලකට යොමුවීමට සිසුන්ගේ දැඩි අරමුණක් නොමැති බව තහවුරු විය. තවද ප්‍රතිඵල අරමුණු කරගෙන දෙමාපියන් දරුවන් පන්ති බොහෝමයකට යොමු කළත් එයින් ප්‍රතිඵලයක් ඇති නොවන බව දරුවන්ගේ අදහස් වලින් ප්‍රත්‍යක්ෂ විය. ඔවුන් පවසන පරිදි අමතර පන්ති කිහිපයකට සහභාගී වීම නිසා නිවැරදි දේ හඳුනා ගැනීමට ඔවුන්ට නොහැකි වන බවයි. තවද විශේෂයෙන් පෙනීගිය කරුණක් වනුයේ, සමස්ත නියැදියෙන් 90% කට පමණ දෙමාපිය බලපෑම දැඩිව පැවතියද මෙම ශිෂ්‍යත්ව විභාගය සමත්ව තිබුනේ 24% පමණ ප්‍රමාණයකි. එහෙත් බහුතරයක් ශිෂ්‍යයින් ලකුණු 100 කඩඉම ඉක්මවා යහපත් ප්‍රතිඵල ලබාගෙන තිබුණි. එයින් යම්තාක් දුරට දෙමාපියන්ගේ උත්සහය සාර්ථක වී ඇති බවක් පෙන්නුම් කළ ද දරුවන්ගේ පැත්තෙන් ඔවුන්ට ඉතා පීඩනයක් වී ඇති බව පැහැදිලි විය. පර්යේෂණය යෝජනා අතර රජය විසින් සියලුම පාසල්වලට සමාන පහසුකම් ලබා දීමට කටයුතු කරන්නේ නම්, ශිෂ්‍යත්ව විභාගය පිළිබඳ දෙමාපියන්ගේ දැඩි තරඟකාරිත්වය තරමක් දුරට මැඩ පවත්වා ගැනීමට හැකියාව ලැබෙනු ඇත. එමෙන්ම ශිෂ්‍යත්ව විභාගය අධ්‍යාපනයේ එකම සංධිස්ථානය නොවන බව දෙමාපියන්ට අවබෝධ කරවීම ද යෝජනා විය.

**මුඛ්‍ය පද :** ශිෂ්‍යත්ව විභාගය, දෙමාපිය බලපෑම, තරඟකාරිත්වය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, medhya8@gmail.com